මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசிய கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION & NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

දිනය / திகதி / Date

# Policy Announcement on Sri Lanka's Domestic Debt Optimisation

1. The policy of the Government of Sri Lanka (Government) concerning Sri Lanka's domestic public debt was approved by Parliament of the Democratic Socialist Republic of Sri Lanka by Resolution on 01 July 2023.

2. Sri Lanka has been facing tremendous economic, humanitarian and social challenges with a severe recession amid high inflation, depleted international reserves, an unsustainable public debt, and heightened financial sector vulnerabilities. Accordingly, with a view to restoring macroeconomic stability and public debt sustainability, safeguarding financial stability, and stepping up structural reforms to unlock Sri Lanka's growth potential, the Government entered into a 48-month extended arrangement under the Extended Fund Facility (EFF) of SDR 2.286 billion (about USD 3.0 billion) with the International Monetary Fund (IMF) which was approved by the Executive Board of the IMF on 20 March 2023.

3. The Domestic Debt Optimisation (DDO) is being carried out consistent with the EFF, to contribute to meeting the Debt Sustainability targets agreed upon with the IMF. It is justified by the ambitious nature of these targets, the need to manage Sri Lanka's public debt rollover risks in the future and the imperative of ensuring a fair contribution from all creditors to the resolution of Sri Lanka's debt problem, without however jeopardizing the stability of the domestic financial system.

4. After a careful analysis of the domestic public debt of Sri Lanka, including its composition, terms and conditions, investor concentrations, accounting treatments and of the potential impact of such DDO to the financial system stability by the Sri Lankan authorities, with the assistance of Sri Lanka's debt advisors, the various elements constituting the DDO have been identified as follows, in summary.

   (a) Conversion/exchange of Treasury Bonds that have been issued under the Registered Stock and Securities Ordinance, No. 7 of 1937 (as amended) into new Treasury Bonds to be issued under the said Registered Stock and Securities Ordinance to certain eligible

holders of Treasury Bonds specifically superannuation funds defined as employee trust fund, an approved provident fund or a pension fund, or an approved termination fund within the meaning of the Inland Revenue Act, No. 24 of 2017 (as amended), with a minimum participation requirement of 100 percent of the total face amount of the Treasury Bonds maturing between 2024 and 2032 (inclusive) and not less than 50 percent of the total face amount of the Treasury Bonds maturing in 2023 outstanding on the business date prior to the date of launch of the said conversion/exchange held by such superannuation funds, to avoid incurring a tax rate to 30 percent on the taxable income attributing from Treasury bond investments of such superannuation funds that may be applied from 1 October 2023 onwards. However, the Treasury Bonds maturing on 15 July 2023 will be excluded from the above perimeter.

(b) Conversion of Treasury Bills that have been issued under the Local Treasury Bills Ordinance, No. 8 of 1923 (as amended) and are held by the Central Bank of Sri Lanka (CBSL) into Treasury Bonds issued under the said Registered Stock and Securities Ordinance.

(c) Conversion of the provisional advances made by the CBSL to the Government of Sri Lanka to be converted into Treasury Bonds to be issued under the said Registered Stock and Securities Ordinance.

(d) Exchange of outstanding Sri Lanka Development Bonds (SLDBs) issued under the Foreign Loans Act, No. 29 of 1957 to Treasury Bonds denominated in United States Dollars or Sri Lanka Rupees issued under the said Registered Stock and Securities Ordinance.

(e) Restructuring of local law foreign currency denominated bank loans of the Government.

5. Questions can be directed to the Superintendent of Public Debt via Email in relation to the Exchange Memorandum for Treasury Bonds at ddo.tbonds@cbsl.lk and the Exchange Memorandum for Sri Lanka Development Bonds at ddo.sldb@cbsl.lk . Any responses to such questions that have general applicability will be promptly posted on the website on the Ministry of Finance, Economic Stabilization and National Policies (https://www.treasury.gov.lk/web/ddo).

**Ministry of Finance, Economic Stabilization and National Policies**

**Democratic Socialist Republic of Sri Lanka**

4th July 2023

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசிய கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION & NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

දිනය / திகதி / Date: 2023 ජූලි 04

## ශ්‍රී ලංකාවේ දේශීය රාජ්‍ය ණය පිළිබඳ ප්‍රතිපත්ති නිවේදනය

1. 2023 ජූලි 01 දින යෝජනාවක් මගින් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ (ස්වෛරී) පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ දේශීය රාජ්‍ය ණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ (රජයේ) ප්‍රතිපත්තිය.

2. ඉහළ උද්ධමනය, ක්ෂය වූ ජාත්‍යන්තර සංචිත, තිරසාර නොවන රාජ්‍ය ණය සහ ඉහළ ගිය මූල්‍ය අංශයේ අවදානම් මධ්‍යයේ ශ්‍රී ලංකාව දැඩි අවපාතයකට මුහුණ දෙමින් දැවැන්ත ආර්ථික, මානුෂීය සහ සමාජීය අභියෝගවලට මුහුණ දී සිටී. ඒ අනුව, සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ රාජ්‍ය ණය තිරසාරභාවය ප්‍රතිෂ්ඨාපනය කිරීම, මූල්‍ය ස්ථාවරත්වය ආරක්ෂා කිරීම සහ ශ්‍රී ලංකාවේ වර්ධන විභවයන් විවෘත කිරීම සඳහා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ වේගවත් කිරීමේ අරමුණින්, රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සමඟ 2023 මාර්තු 20 වැනි දින ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායක මණ්ඩලය විසින් අනුමත කරන ලද SDR බිලියන 2.286 ක (එක්සත් ජනපද ඩොලර් බිලියන 3.0 ක පමණ) විස්තීරණ අරමුදල් පහසුකම (EFF) යටතේ මාස 48 ක වැඩපිළිවෙළකට එළඹුණි.

3. දේශීය ණය ප්‍රශස්තකරණය (DDO) විස්තීර්ණ ණය පහසුකමේ කොන්දේසියක් වන අතර, එය ජත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එකඟ වී ඇති ණය තිරසාර භාවය මගින් ඉලක්ක සපුරාගැනීමට උපකාරී වේ. දේශීය මූල්‍ය පද්ධතිය අනතුරකට පත්කිරීමකින් තොර වූ මෙම ඉලක්ක වල අභිලාෂයේ ස්වරූපය, අනාගතයේදී ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය ප්‍රති නිකුතුව තුළින් පියවීමේ අවධානම පාලනය කිරීමේ අවශ්‍යතාවය හා ශ්‍රී ලංකාවේ ණය ප්‍රශ්ණය විසදීමේදී සියළුම ණය හිමියන්ගේ සාධාරණ දායකත්වයක් තහවුරුකිරීම මෙමගින් සිදුකරනු ලබයි.

4. ශ්‍රී ලංකාවේ ණය උපදේශකයන්ගේ සහාය ඇතිව, ශ්‍රී ලංකාවේ දේශීය රාජ්‍ය ණය සංයුතිය, එහි නියමයන් සහ කොන්දේසි, ආයෝජකයන්ගේ සාන්ද්‍රණය, ගිණුම්කරණ ප්‍රතිකාර සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයට එවැනි දේශීය ණය ප්‍රශස්තකරණය මගින් ඇති විය හැකි බලපෑම ඇතුළුව ශ්‍රී ලංකාවේ දේශීය රාජ්‍ය ණය පිළිබඳ සියුම් විශ්ලේෂණයකින් පසුව, දේශීය ණය ප්‍රශස්තකරණය මගින් විවිධ අංශවල ඇති විය හැකි බලපෑම පහත සාරාංශ කරනු ලබයි.

(අ) 2023 ඔක්තෝබර් 01 වැනිදා සිට යෙදිය හැකි එවැනි අධි විශ්‍රාමික අරමුදල්වල, භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජනවලින් ආරෝපණය කළ හැකි, බදු අය කළ හැකි ආදායම මත සියයට 30ක් දක්වා බදු අනුපාතයක් අය නොකිරීම සඳහා,

භාණ්ඩාගාර බැඳුම්කරවල ඇතැම් සුදුසුකම් ලත් හිමිකරුවන්ට විශේෂයෙන් 2017 අංක 24 දරන දේශීය අදායම් පනත ( සංශෝධනය පරිදි) යටතේ අදහස් වන සේවක අර්ථසාධක අරමුදලක්, අනුමත අර්ථසාධක අරමුදලක්, විශ්‍රාම අරමුදලක් හෝ අනුමත සේවය අවසන් කිරීමේ අරමුදලක් (විශාල අරමුදලක්), යෝජිත පරිවර්තනය හෝ හුවමාරුව ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමේ දිනට පෙර ව්‍යාපාරික දිනදී පැවති, 2024 හා 2032 අතර ( වර්ෂ දෙකම ඇතුළුව) පරිණත වන භාණ්ඩාගාර බැඳුම්කර වල මුළු වටිනාකමින් 100% හා 2023 දී පරිණත වන භාණ්ඩාගාර බැඳුම්කර වල මුළු වටිනාකමින් 50% කට නොඅඩු ප්‍රමාණයක් ගැලපීම සඳහා, 1937 අංක 7 දරන (සංශෝධිත පරිදි) ලියාපදිංචි කළ කොටස් හා සුරැකුම්පත් ආඥාපනත යටතේ නිකුත් කර ඇති භාණ්ඩාගාර බැඳුම්කර, එම ලියාපදිංචි කොටස් සහ සුරැකුම්පත් ආඥාපනත යටතේ නිකුත් කරනු ලබන නව භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කිරීම/හුවමාරු කිරීම. කෙසේ වෙතත්, 2023 ජූලි 15 දින කල් පිරෙන භාණ්ඩාගාර බැඳුම්කර ඉහත පරිමිතියෙන් බැහැර කරනු ලැබේ.

(ආ) 1923 අංක 8 දරන (සංශෝධිත පරිදි) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නිකුත් කර ඇති භාණ්ඩාගාර බිල්පත් 1937 අංක 7 දරන ලියාපදිංචි කොටස් හා සුරැකුම්පත් ආඥාපනත (සංශෝධිත පරිදි) යටතේ නිකුත් කිරීමට නියමිත භාණ්ඩාගාර බැඳුම්කර බවට පත් කිරීම.

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජයට ලබා දෙන තාවකාලික අත්තිකාරම් එකී ලියාපදිංචි කොටස් හා සුරැකුම්පත් ආඥාපනත (සංශෝධිත පරිදි) යටතේ නිකුත් කිරීමට නියමිත භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කිරීම.

(ඈ) 1957 අංක 29 දරන විදේශ ණය පනත යටතේ නිකුත් කරන ලද ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර 1937 අංක 7 දරන (සංශෝධිත පරිදි) ලියාපදිංචි කොටස් සහ සුරැකුම්පත් ආඥාපනත යටතේ නිකුත් කිරීමට නියමිත ශ්‍රී ලංකා රුපියල් සහ/හෝ ඇමරිකා එක්සත් ජනපද ඩොලර් භාණ්ඩාගාර බැඳුම්කර වෙත හුවමාරු කිරීම.

(ඉ) රජයේ දේශීය නීතිය යටතේ නිකුත් කරන ලද විදේශ විනිමය බැංකු ණය ප්‍රතිව්‍යුහගත කිරීම.

5. භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන හුවමාරු යෝජනාවට අදාළව ගැටලු ddo.tbonds@cbsl.lk සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා වන හුවමාරු යෝජනාවට අදාළව ගැටලු ddo.sldb@cbsl.lk යන ලිපිනයෙන් රාජ්‍ය ණය අධිකාරී වෙත විද්‍යුත් තැපැලෙන් යොමු කළ හැකිය. පොදු අදාළත්වයක් ඇති එවැනි ගැටලු සඳහා ඕනෑම ප්‍රතිචාරයක් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ (www.treasury.gov.lk) වෙබ් අඩවියේ වහාම පළ කරනු ලැබේ.

**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**